# 5

# අල් ඉස්ලාම්

අක්මල් : අස්සලාමු අලයික්කුම්. මුහම්මද්.

මුහම්මද් : වඅලයිකුමුස්සලාම්. අක්මල්.

අක්මල් : ඔයා ඊයේ ඉස්කෝලයට ගියා ද?

මුහම්මද් : ඇයි ඔයා ඊයේ පාසලට ගියේ නැත්ද ?

අක්මල් : මගේ මාමා අසනීප වෙලා. එයගේ සැප දුක් විමසන්න තාත්තා එක්ක ගියා.

මුහම්මද් : මාෂාඅල්ලාහ්. හොඳ වැඩක්. අපි ඊයේ ඉස්ලාම් පාඩමේ දී අල් ඉස්ලාම් යන මාතෘකාව යටතේ ගොඩක් දේවල් ඉගෙන ගත්තා.

අක්මල් : ඉතින් ඒ ගැන මටත් කියන්න.

මුහම්මද් : ඉස්ලාම් යන අරාබි වචනයට සාමය, පාලනය, අවනතවීම, භාරවීම වගේ තේරුම් තියෙනවා. අල්ලාහ් විසින් දායාද කළ අවසාන ආගම එයයි. එයට අර්කාන් පහක් තියෙනවා.

අක්මල් : අර්කානුල් ඉස්ලාම් කියන්නේ මොකක් ද?

මුහම්මද් : අර්කානුල් ඉස්ලාම් කියන්නේ ෂහාදා, සලාත්, සකාත්, සව්ම් සහ හජ් වැනි වගකීම්වලට.

අක්මල් : ෂහාදා කියන්නේ මොකක් ද?

මුහම්මද් : ෂහාදා යනු නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවකු නැත යැයි ද මුහම්මද් සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමා ඔහුගේ රසූල් යැයි ද සාක්කි දරමින් විශ්වාස කිරීමයි.



අක්මල් : අනෙකුත් වගකීම් ගැනත් කියන්න.

මුහම්මද් : සලාත් යනු, පස් වේල් ඉටුකළයුතු නැමදුම ඉටුකිරීමත්, සකාත් යනු පහසුකම් ඇති අය තම ධනයෙන් නියමිත කොටසක් දුගී දුප්පතුන් වෙනුවෙන් දන් දීමත්, සව්ම් යනු රමළාන් මාසයේ උපවාසයේ යෙදීමත්, හජ් යනු පහසුකම් හා අවස්ථා ඇති අය ශුද්ධ වූ මක්කම නගරයට ගොස් ඉටු කරන වගකීමත් වන්නේය. මේවාට අමතරව ඉස්ලාමයට අදාළව වෙනත් සුවිශේෂතා ඇත.

අක්මල් : ඒ ගැන විස්තර කරලා කියන්න පුළුවන් ද?

මුහම්මද් : ඉස්ලාම් අල්ලාහ් පහළ කළ අවසාන ආගම වන්නේ ය. එය ස්වාභාවික ආගමකි. මිනිස් ජීවිතයේ සියලුම අවස්ථා වල හා කාල වල හා ස්ථාන වල අනුගමනය කළ හැකි ආගමකි. යුක්තිය, ඉවසා දරා ගැනීම අවංකත්වය, සහජීවනය ආදිය එහි සුවිශේෂතා ය. ජීවිතයේ සියලුම කරුණුවල දී ඉස්ලාම් පවසන යහමාර්ගය අනුගමනය කිරීමෙන් සාරධර්ම සහ යහගුණයන් වර්ධනය වන්නේ ය. තව ද අල්ලාහ් අප නිරීක්ෂණය කරන්නේය. කියාමාවේ දී අපගේ ක්‍රියා ගැන ප්‍රශ්න කරනු ලබන්නේ ය යන හැඟීම නිසා යහමග අනුගමනය කිරීමට පොළඹවනු ලබන්නෙමු.

අක්මල් : ඉස්ලාමීය ජීවන ක්‍රමය අනුගමනය කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද?

මුහම්මද් : මෙලොව ජීවිතයේ සැනසීම, අල්ලාහ්ගේ තෘප්තිය හා ස්වර්ගයේ ජීවිත් වීමේ අවස්ථාව.

අක්මල් : ජසාකල්ලාහු හෛරා

මුහම්මද් : අපි අපගේ ජීවිතයේ මේවා අනුගමනය කරමු. ඉන්ෂා අල්ලාහ්.

අභ්‍යාසය

පහත සඳහන් ප්‍රකාශ හරි නම් (හරි) යැයි ද වැරදි නම් (වැරදි) යැයි ද ලියන්න.

1. ඉස්ලාම් යන අරාබි වචනයේ අදහස පාලනය කිරීම හෝ භාර වීම යන්න ය. ( )

2. අර්කානුල් ඉස්ලාම් යන්නෙන් අදහස් වන්නේ ඉස්ලාමයේ වගකීම් ය. ( )

3. ඉස්ලාම් කුළුණු පහක් මත නිර්මාණය කර ඇත. ( )

4. ඉවසා දරා ගැනීම, සහජීවනය යන්න ඉස්ලාමයට පරිබාහිර ඒවා ය. ( )

5. ඉස්ලාමීය මගපෙන්වීම නොසලකා හරින අය ස්වර්වයට යති. ( )